# 多言語情報コーナー　　　　　　　　（令和５年　５月号）

**1.සාමාන්‍ය වාහන බද්ද සහ සැහැල්ලු වාහන බද්ද පිළිබඳව**

සෑම වසරකම අපේ්‍රල් 01 වෙනිදා තමන්ගේම මෝටර් රථයක් ඇති අය බදු ගෙවීමක් සිදුකල යුතුවේ.වාහනයේ ධාරිතාවය 660cc ට වැඩි වාහන සඳහා සාමාන්‍ය වාහන බද්දද ධාරිතාවය 660cc හෝ ඊට අඩු මෝටර් රථ සැහැල්ලු වාහන බද්දටද සහ යතුරුපැදිද බද්දකට යටත් වේ.

මැයි මාසයේදී, මෝටර් රථ හිමි පුද්ගලයින් වෙත සැහැල්ලු වාහන බදු සහ සාමාන්‍ය වාහන බදු ගෙවීම් පත්‍රිකා එවනු ලැබේ. ගෙවිය යුතු බදු ප්‍රමාණය  මෝටර් රථ වර්ගය අනුව තීරණය වේ.

මෙම බදු ගෙවීමේ අවසන් දිනය මැයි 31 වේ. ගෙවීම් කාල සීමාව තුළ ගෙවීමට වග බලා ගන්න.

නියමිත දිනට වාහන බද්ද ගෙවිය නොහැකි අය සාමාන්‍ය වාහන බදු සඳහා තොචිගි ප්‍රාන්ත බදු කටයුතු කාර්යාල වෙත සහ සැහැල්ලු මෝටර් රථ බද්ද සඳහා තොචිගි නගර ශාලාවේ බදු කටයුතු අංශයෙන් විමසන්න.

## 2. ස්ථාවර ප්‍රාග්ධන බද්ද සහ නගර සැලසුම් බද්ද පිළිබඳව

සෑම වසරකම ජනවාරි 01 වැනි දින ඉඩම්, නිවාස සහ රැකියාවේ හෝ ව්‍යාපාර ආදිය සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර සූත්‍ර ආදී ස්ථාවර වත්කම් ඇති පුද්ගලයින්ට බද්දක් ගෙවීමට සිදු වේ.

මැයි මාසයේදී ඔබට ගෙවිය යුතු බදු මුදල සඳහන් ගෙවීම් පත නගර කාර්යාලය විසින් තැපැලෙන් එවනු ලැබේ.

මෙම ස්ථාවර ප්‍රාග්ධන බද්ද සම්පූර්ණයෙන් එකවරද  ගෙවිය හැකි අතර එසේ එකවර ගෙවීමට නොහැකිනම් එය වාරික හතරක් ලෙස බෙදා ගෙවීම් කල හැකිය.

සම්පූර්ණ මුදල ගෙවීම සහ කොටස් වශයෙන් ගෙවන්නේ නම් එහි පළමු වාරිකය ගෙවීමේ අවසාන දිනය මැයි 31 වේ.මෙම ගෙවීම් නියමිත කාල සීමාව තුළ ගෙවීමට වග බලා ගන්න.

මීට අමතරව 2023 වර්ෂය සඳහා වූ  ස්ථාවර වත්කම් බද්ද සහ සැහැල්ලු මෝටර් වාහන බද්ද සඳහා ඔබ වෙත එවනු ලබන ගෙවීම් පත්‍රිකාව තුල QR කේතය මුද්‍රණය කර ඇති අතර මෙම QR කේතය භාවිතයෙන් ස්මාර්ට් ජංගම දුරකථන ගෙවීම් යෙදුම්, ක්‍රෙඩිට් කාඩ්පත් සහ අන්තර්ජාල බැංකුකරණය වැනි විවිධ ක්‍රම භාවිතා කර ගෙවීම් කළ හැකිය.

ඔබට රිසිට්පතක් අවශ්‍ය නම්, කරුණාකර නගර ශාලාවේ කවුළුව වෙත හෝ කොම්බිනි වෙළඳසැලකින් හෝ බැංකු හුවමාරු කවුළුවකට ගෙවීම් කල යුතුය .

**3. බයිසිකල් පැදීමේදී හෙල්මට් එකක් පැළඳීම පිලිබදව**

2023 අප්‍රේල් 01 වනදා සිට මාර්ග නීති වෙනස් වනු අතර , ඒ වෙනුව සියලුම පාපැදි පදින්නන්
හිස්වැසුම් පැළඳීම ආරක්ෂාකාරී පියවරක් ලෙස අනිවාර්ය කර ඇත.

මෙහිදී අනිවාර්ය කිරීමක් ලෙස හදුන්වනු ලබන්නේ පාපැදි පදින්නන් විසින් ආරක්ෂාකාරී ලෙස මර්ගනිති අනුගමනය කිරීමක් ලෙසයි.මෙහිදී හිස්වැසුමක් පැළද නොසිටීම වෙනුවෙන් පොලිසිය මගින් දඩුවම් කිරීමක් සිදු නොවේ .

නමුත් පොලිස් දෙපාර්තමේන්තුවට අනුව පාපැදි වල ගමන් කිරීමේදී සිදුවන අනතුරු වලින් පුද්ගලයන්ගෙන් 60%කට පමණ හිසට මාරාන්තික තුවාල සිදුවන බවත් එසේ හිස් වැසුම් පැළඳ නොසිට මියයන පුද්ගලයින්ගේ මරණ අනුපාතය හිස් වැසුම් පැළඳ සිටි පුද්ගලයින්ගේ මරණ අනුපාතයට වඩා 2.1 ගුණයකින් වැඩි බවය.

පාපැදිවල ගමන් කිරීමේදී හෙල්මට් එකක් පැලදීම අනතුරකදී තුවාල අඩුකර ගැනීමට හේතුවන බැවින් හිස්වැසුමක් පැළදීමට වගබලා ගමු.

ඔබ හිවසුමක් මිලදී ගැනීමේදී එහි ආරක්ෂිත බව සනාථ කර ඇති බවට සහතික කර ඇති SG ලකුණ ඇති හිස් වැසුමක් තෝරා ගැනීම සුදුසු වේ.

හිස්වැසුම් පාපැදි අලෙවි කරන ස්ථාන වල සහ Home Center නමින් හදුන්වනු ලබන ස්ථාන වලදී මිලදී ගත හැක.

**4. නව කොරෝනා වයිරස් ආසාදනය පිලිබඳව**

නව කොරෝනා වයිරස් ආසාදනය මැයි මස 8 වන දින එය "5 වන පන්තියේ බෝවන රෝග" කාණ්ඩය ලෙස වර්ගීකරණය කර ප්‍රකාශයට පත් කෙරේ.
එය 5 පන්තියේ බෝවන රෝග කාණ්ඩය බවට වෙනස් කළහොත් රට හදිසි තත්වයන් බවට හෝ යම් යම් සීමා පැනවීම් සම්බන්දයෙන් සීමා පැනවීමට නොහැකි වනු ඇත.
ප්‍රතිකාර කිරීමේ කාලය ,රෝග නිවාරණ කාල සීමාව සහ උස්ණත්වය ආදිය විශාල වෙනසකට ලක්වන අතර මෙතෙක් මුදල් වැය නොවූ රෝහල් ගාස්තු ,පරීක්ෂණ ගාස්තු ආදියෙන් කොටසක් තමන් විසින් දැරීමට සිදු වේ .
මුහුණු ආවරණයක් පැලදීම තමන්ගේ අභිමතය පරිදි සිදුකල හැක.

මීට අමතරව, රජය විසින් ආසාදිත පුද්ගලයින්ගේ සංඛ්‍යාව පිළිබඳ දිනපතා වාර්තා එකතු කර ප්‍රකාශයට පත් කිරීමක් සිදු කරනු නොලැබේ.

විශේෂයෙන්ම, මුහුණු ආවරණයක් පැළඳීම පුද්ගලයාගේ අභිමතය මත තීරණය වන අතර තවදුරටත් වෙනත් පුද්ගලයන්ගේ කැමැත්ත මත මුහුණු ආවරණයක් පැළඳීමට බල නොකරනු ඇත. කෙසේ වෙතත්, වෛද්‍ය පරීක්‍ෂණයක් කරන විට වෛද්‍ය මධ්‍යස්ථානයකට හෝ වයෝවෘද්ධ අය සඳහා පහසුකම්වලට ගිය විට, ඔබ සෙනඟ පිරුණු දුම්රියකට හෝ බස් රථයකට ගොඩ වූ විට, ඔබට ආසාදනය වීම වළක්වා ගැනීම සඳහා මුහුණු ආවරණයක් පැළඳීම ඵලදායි ක්‍රමයකි.

අත් සේදීම,විෂබීජ හරණය ,පිරිසිදු වාතාශ්‍රය ලබාගැනීම වැනි මූලික කරුණු බෝවන රෝග වලක්වා ගැනීමේ ක්‍රම වන අතර ඒවා තවදුරටත් රජය මගින් සිදු නොකරන අතර තමන් විසින් හෝ ඒ ඒ ආයතන වල අවශ්‍යතාවය මත සිදු කරනු ලැබේ.

මීට අමතරව, නව කොරෝනා එන්නත් කිරීම 2023 වසර තුලද සියලු දෙනාටම නොමිලේ ලබාගත හැක.

සියලුම පුද්ගලයින් එන්නත් කිරීම සැප්තැම්බර් මාසයේ සිට ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර එන්නත් කිරීම අනිවාර්ය නොවන අතර තමන්ගේ කැමැත්ත මත තීරණය කර හැක.එන්නත් කිරීමේ ක්‍රියාවලිය දැනුම් දීමක් සිදුකරන අතර දැනුම් දීමෙන් පසු එන්නත් කිරීම පිළිබඳ අවදානයෙන් ඉන්නා ලෙස ඉල්ලා සිටිමු.